# අ.පො.ස (උසස් පෙළ)

# ආර්ථික විද්‍යාව



# මූලික ආර්ථික ගැටලු

## නිපුණතාවය 1.5 : මූලික ආර්ථික ප්‍රශ්ණ විමසයි

### 1.5.1 ඕනෑම ජන සමාජයක් හිඟකම නිසා මූලික ආර්ථික ප්‍රශ්ණ තුනකට මුහුණ දෙයි.

1. කුමක් කොපමණ නිපදවනවාද
2. කෙසේ නිපදවනවාද
3. කා සඳහා නිපදවනවාද

### 1.5.2 කුමක් කොපමණ නිපදවනවාද යන ගැටළුව.

- විකල්ප ප්‍රයෝජන සහිත සීමිත සම්පත් වලින් සමාජයට අසීමිත වුවමනා සපුරාගැනීමට අවශ්‍ය කුමන භාණ්ඩ හා සේවා නිපදවනවාද, කවර ප්‍රමාණයක් නිපදවනවාද, යනුවෙන් මුහුණපාන ගැටළුව කුමක් කොපමණ නිපදවනවාද යන ගැටළුව වේ. මෙම ගැටළුව සම්පත් බෙදා වෙන්කිරීම පිළිබඳ ගැටළුව යනුවෙන්ද හඳුන්වයි.
- මෙම ගැටළුව මතුවන්නේ පහත හේතු නිසාය.
  - මිනිස් උවමානා අසීමිත වීම
  - සම්පත් සීමිත වීම
  - සම්පත්වල විකල්ප භාවිත පැවතීම

නිදසුන



- මෙම පුද්ගලයා මුහුණ පා ඇති ගැටළුව සීමිත සම්පත්වලින් කුමන භාණ්ඩය කවර ප්‍රමාණයක් නිපදවනවාද යන්නය.


Copyright © e-thaksalawa.moe.gov.lk

## 1.5.3 කෙසේ නිපදවනවාද.

- විකල්ප ශිල්පීය ක්‍රම අතුරින් කුමන ශිල්ප ක්‍රමය භාවිත කොට භාණ්ඩ නිපදවනවාද යන ගැටළුව කෙසේ නිපදවනවාද යන ගැටළුව වේ.
- නිෂ්පාදන සාධක සංයෝග කල හැකි විකල්ප ශිල්ප ක්‍රම දෙකක් ඇත.
    1. ශ්‍රම සූක්ෂම ශිල්ප ක්‍රමය
    2. ප්‍රාග්ධන සූක්ෂම ශිල්ප ක්‍රමය

- **ශ්‍රම සූක්ෂම ශිල්ප ක්‍රමය** යනු අනෙකුත් නිෂ්පාදන සාධක වලට සාපේක්ෂව ශ්‍රමය බහුලව භාවිතා කරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.

  **නිදසුන් :** ශ්‍රී ලංකාවේ පැදුරු විවීම, තේ නෙලීම.

- **ප්‍රාග්ධන සූක්ෂම ශිල්ප ක්‍රමය** යනු අනෙකුත් නිෂ්පාදන සාධක වලට සාපේක්ෂව ප්‍රාග්ධනය බහුලව භාවිත කරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.

  **නිදසුන් :** මෝටර් රථ නිපදවීමේ කර්මාන්තය.

- ඉහත සඳහන් ශිල්ප අතුරින් කවර ශිල්ප ක්‍රමය යොදාගනිමින් භාණ්ඩ නිපදවනවාද යන ගැටළුව මින් අදහස් වේ. කෙසේ නිපදවනවාද යන ගැටළුව නිෂ්පාදනය පිළිබඳ ගැටළුව වේ.



- පාර සෑදීම සඳහා යොදා ගන්නේ කුමන ශිල්පීය ක්‍රමය ද යන්න ගැටළුව කෙසේ නිපදවන්නේද යන ගැටළුවයි.



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**1.5.4 කා සඳහා නිපදවනවාද යන ගැටළුව නිෂ්පාදිතය ජනතාව අතර බෙදීයන්නේ කෙසේද යන ගැටළුව කා සඳහා නිපදවනවාද යන ගැටළුව වේ.**

නිදසුන



- නිෂ්පාදිතය බෙදීයන්නේ පුද්ගලයින් අතර ආදායම් ව්‍යාප්තවන ආකාරය අනුව බැවින් මෙම ගැටළුව ආදායම් බෙදීයාම පිළිබඳ ප්‍රශ්ණය ලෙසද හඳුන්වයි.



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

නිපුණතාවය **1.5 :** මූලික ආර්ථික ප්‍රශ්ණ විමසයි

## ක්‍රියාකාරකම

| ආර්ථික සංසිද්ධිය | නිරූපණය වන මුල්ම ආර්ථික ගැටළුව |
|---|---|
|  | |
|  | |
|  | |

අන්තර්ගතය - ඩබ්. ලයනල් - විසාකා විද්‍යාලය, බී.එස්. තිලකරත්න - ස්වර්ණමාලි බා.ම.වි, අයි.පී.එස්. පද්මිණී - ශාන්ත ජෝශප් බා.ම.වි.

සැකසුම - එල්.ඒ. යසිතා රසාංජලී - ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය - මිලාගිරිය

The National e-learning Portal for the General Education

Copyright © e-thaksalawa.moe.gov.lk